261754

[illegible]
06-2-1996
[illegible] SRI LANKA ශ්‍රී ලංකා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 895/15 - 1995 නොවැම්බර් 01 වැනි බදාදා - 1995.11.01
895/15 ஆம் இலக்கம்--1995 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 01 ஆம் திகதி புதன்கிழமை
No. 895/15 - WEDNESDAY, NOVEMBER 01, 1995

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.-බී. 19/78.

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 60 වන වගන්තිය යටතේ, අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, වැඩබලන අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

1995 [illegible] වැනි දින,
කොළඹ දී ය.

[illegible]
වැඩබලන අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු
අමාත්‍ය.

නියෝගය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය යටතේ සාදන ලදුව 1978 ජූලි මස 05 වැනි දින අංක 43/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, ඊට පසු කලින් කල සංශෝධනය කරන ලද්දාවූ නියෝගයේ උපලේඛනයෙහි අගට පහත දක්වෙන විෂයය එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"I වන තීරය අධිකරණ	II වන තීරය නීති කෘත්‍ය හෝ කාරණා වර්ගය
බස්නාහිර පළාත තුළ පිහිටි කොළඹ, කළුතර සහ ගම්පහ දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය හෝ කාරණා
මධ්‍යම පළාත තුළ පිහිටි මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා
සබරගමුව පළාත තුළ පිහිටි රත්නපුර සහ කෑගල්ල දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා
ඌව පළාත තුළ පිහිටි බදුල්ල සහ මොණරාගල දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා
වයඹ පළාත තුළ පිහිටි කුරුණෑගල සහ පුත්තලම දිසා අධිකරණ සහ කුරුණෑගල සහ හලාවත මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා
උතුරු මැද පළාත තුළ පිහිටි අනුරාධපුර සහ පොළොන්නරුව දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා
දකුණු පළාත තුළ පිහිටි ගාල්ල, මාතර සහ තංගල්ල දිසා අධිකරණ සහ ගාල්ල, මාතර, මොරවක සහ තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණ	යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය සහ කාරණා".

11-55

1A - D 037923 - 1,385 (95/10)